# සී/ස රජරට විශ්වවිද්‍යාලයීය සමුපකාර සමිතිය

# තනතුරු පුරප්පාඩු

සී/ස රජරට විශ්වවිද්‍යාලයීය සමුපකාර සමිතිය රජරට විශ්වවිද්‍යාලයීය සේවයේ නියුක්තවූවන්ගේ සාමාජිකත්වයෙන් සැදුම්ලත් සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කර ඇති සමුපකාර සමිතියකි.

මෙම සමිතියේ පුරප්පාඩුවී ඇති කළමනාකරණ සහකාර තනතුර සඳහා කුසලතා පූර්ණ උද්යෝගීමත් සහ කැපවීමෙන් වැඩකිරීමේ හැකියාව ඇති අදාළ සුදුසුකම් සැපිරූ අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ගිණුම්කරණ කටයුතු සම්බන්ධයෙන් පළපුරුද්දක් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

## කළමනාකරණ සහකාර - 0.1 (මෙහෙයුම් ශ්‍රේණිය III වන පන්තිය)

**සුදුසුකම්**

- අ.පො.ස. උ/පෙළ සාමාර්ථය සමඟ දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. සා/පෙළ ගණිතය, භාෂාව සහ ඉංග්‍රීසි ඇතුළුව විෂයන් 04කට සම්මාන තිබීම.

**හෝ**

- ගණිතය, භාෂාව සහ ඉංග්‍රීසි ඇතුළුව විෂයන් 05කට සම්මාන සහිතව අ.පො.ස. සා/පෙළ සමත් වීම සහ ජාතික සමුපකාර මණ්ඩලය විසින් පිරිනමනු ලබන සමුපකාර සංවර්ධන සා/පෙළ සාමාර්ථය සමඟ පිළිගත් වාණිජ කාර්මික ආයතනයක කාර්යාල කටයුතු පිළිබඳ වසරක පළපුරුද්ද.

**හෝ**

- කාර්යාල කළමනාකරණ විෂයට සම්මාන සහිතව ජාතික සමුපකාර මණ්ඩලය විසින් පිරිනමනු ලබන සමුපකාර සංවර්ධන සා/පෙළ සාමාර්ථය සමඟ පිළිගත් වාණිජ කාර්මික ආයතනයක කාර්යාල කටයුතු පිළිබඳ වසර 02 කට නොඅඩු පළපුරුද්ද.

**හෝ**

- කාර්යාල කාර්ය සහයක තනතුරේ I වන පන්තියේ වසර 05ක පළපුරුද්ද.

  වැටුප් පරිමාණය - 17,600 - 170 X 10 - 190 X 10 - 21,200

  ඉහත මාසික වැටුපට අමතරව රු.17,800 ක ජීවන වියදම් දීමනාව සහ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමත දීමනා හිමිවේ.

**පොදු කොන්දේසි**

- අයදුම්කරුවන් වයස අවු. 18ත් 45ත් අතර විය යුතුය.
- ජීවදත්ත සහිත සියළුම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද ඇතුළත්ව තමා විසින්ම සකස් කළ අයදුම් පත්‍රයක් මගින් ඉල්ලුම් කළ යුතු අතර, දැනටමත් සමුපකාර සමිතියක සේවය කරන අයදුම්කරුවන් අදාල අයදුම්පත්‍රය එම සමුපකාර සමිතිය මගින් ඉදිරිපත් කළ යුතුය.
- මෙම තනතුර විශ්‍රාම වැටුප් රහිත වන අතර, තෝරාගනු ලබන අයගේ වැටුපෙන් 8% ක් ද, ආයතනයෙන් 12% ක්ද සමඟ සේවක අර්ථ සාධක අරමුදලට බැර කරනු ඇත. සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලබන අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.
- තමාගේ අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද දක්වෙන සහතිකවල සහතික කළ පිටපත්ද, උප්පැන්න සහතිකය සහ ජාතික හැඳුනුම්පතේ පිටපතක්ද සමඟ අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කර 2024-12-03 දින දහවල් 12.00 ට පෙර

සභාපති, සී/ස රජරට විශ්වවිද්‍යාලයීය සමුපකාර සමිතිය, රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

**සභාපති, සී/ස රජරට විශ්වවිද්‍යාලයීය සමුපකාර සමිතිය,**
**රජරට විශ්වවිද්‍යාලය. මිහින්තලේ.**
**2024-11-19**